# තාඩන, පීඩන හා ඝාතනයට ලක් වූ ලාංකේය භික්ෂූන් වහන්සේ පිලිබඳ සංක්ෂිප්ත සටහනක් (අනුරපුර යුගයේ සිට මෑත සමය තෙක්)

**මහාචාර්ය කරුණාසේන හෙට්ටිආරච්චි**

මහාචාර්ය, ඉතිහාස හා පුරාවිද්‍යා අධ්‍යයන අංශය, ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය.

**Abstract**

It is acknowledged that the Sri Lankan monk has made a major role in Sri Lankan society for over two thousand five hundred years. From the day they entered the life of a bhikkhu, they departed from secular practices and embarked on a unique path. The basic characteristic of a bhikkhu is to devote himself to the healing of himself and others, apart from the goths, body form, dress, rituals, etc. He always tries to establish his followers in the Dhamma by following the teachings of the Buddha. Much information about is contained in the Tripitaka literature. This article seeks to summarize the persecution and persecution faced by the Sri Lankan Bhikku Bhikku Sasana, a country with a history of over two thousand five hundred years, which has been subjected to various forms of conflict and powerfully subjected to Mahayana concepts. Whether they are fair or unfair is not discussed here. The Sri Lankan monk may have been subjected to other forms of persecution, torture and murder in the past, but very few have been reported, so this is inevitably an incomplete note.

***Key Words :*** Sri Lankan monk, Tripitaka literature, Bhikku Sasana, Mahayana concept, torture and murder

## හැඳින්වීම

වසර දෙදහස් පන්සියයක කාලය පුරා ශ්‍රී ලාංකේය භික්ෂුව මෙරට සමාජයෙහි ප්‍රමුඛතම කාර්ය භාරයක් ඉටු කළ බව පිළිගත යුතු සත්‍යයකි. උන්වහන්සේලා භික්ෂු ජීවිතයට ඇතුළත් වූ දින සිටම ගිහි චර්යා රටාවෙන් ඉවත්ව සුවිශේෂ වූ ගමන් මාර්ගයකට අවතීරණය වන්නාහ. නම් ගොත්, ශරීර ස්වරූපය, ඇඳුම් පැලඳුම්, චාරිත්‍ර

චාරිත්‍ර, ඇවතුම් පැවතුම් ආදී සියල්ලෙන්ම වෙන්ව අත්තායහිත මෙන්ම පරහිතකාමී චර්යාවෙහි යෙදීම භික්ෂුවගේ මූලිකම ලක්ෂණයයි. උන්වහන්සේලා සෑම විටම බුදුන්වහන්සේගේ දේශනා අනුගමනය කරමින් ධම්මානුධම්ම ප්‍රතිපදාවෙහි පිහිටා අනුග ාමිකයන් ද එම ප්‍රතිපදාවෙහි පිහිටුවීමට සෑම කල්හිම උත්සාහ දරන්නාහ. ඉන්දියාවෙහි ආරම්භක සමයෙහි භික්ෂු ජීවිතය පිළිබඳ බොහෝ තොරතුරු ත්‍රිපිටක සාහිත්‍යයෙහි අන්තර්ගතව ඇතත් මෙම ලිපියෙන් උත්සාහ ගනු ලබන්නේ ලාංකේය භික්ෂු ජීවිතය හා සම්බන්ධ එක් අංශයක් පමණක් අධ්‍යයනය කිරීම පමණි.

ක්‍රි:පූ: 3වන සියවසෙහි මහින්දාගමනයත් සමග ලක්දිව ස්ථාපනයවන භික්ෂු ශාසනයෙහි ක්‍රියාකාරී භික්ෂූන්වහන්සේලා වසර සියයක් තරම් කෙටි කලකින්ම මුළු ලක්දිව පුරාම පාහේ වැඩ සිටි බව මූල බ්‍රාහ්මී ලෙන් ලිපිවලින් පැහැදිලි වෙයි (paranavitana 1970). කෙසේ වෙතත් ලක්දිව භික්ෂු සාසනය වසර දෙදහස් පන්සියයක කාලය පුරා විවිධාකාරයේ හැලහැප්පීම් ගැටුම් වැටුම්වලට ලක්වෙමින් ප්‍රබල ලෙස මහායානික සංකල්ප වලට ද නතු වෙමින් වර්තමානය දක්වා පැවත එන බව සඳහන් කළ හැකි ය. එම ගමන් මගෙහි ලාංකේය භික්ෂුව මුහුණ පෑ තාඩන පීඩන හා ඝාතනය වීම් ගැන සංක්ෂිප්ත සටහනක් මෙම ලිපිය මගින් ඉදිරිපත් කරනු ලැබේ. ඒවා සාධාරණ ද අසාධාරණ ද යනු මෙහි සාකච්ඡා නොකෙරේ. අතීතයේ සිට ලාංකේය භික්ෂුව අනේක විධ තාඩන පීඩන, වධ බන්ධන හා ඝාතනය කිරීම්වලට ලක්වන්නට ඇතත් ඒවා වාර්තා වන්නට ඇත්තේ ඉතා ස්වල්පයක් පමණි. එබැවින් මෙය අසම්පූර්ණ සටහනක් වීම වැලැක්විය නොහැකිය.

**අන්තර්ගතය**

ඓතිහාසික තොරතුරු අධ්‍යයනයේ දී භික්ෂුව ප්‍රධාන කරුණු 4කින් පීඩාවට පත්වූ බව පෙනීයයි.

1. දේශපාලන හේතු
2. ආගමික හේතු
3. පෞද්ගලික හේතු
4. වෙනත්

උක්ත තත්වයන් යටතේ භික්ෂූන් වහන්සේලා ආකාර කීපයකින් පෙලීමට ලක් වූ බව පෙනීයයි.

1. ඝාතනයට ලක්වීම
2. ශාරීරික හිංසනයට ලක්වීම.
3. මානසික හිංසනයට ලක්වීම.
4. පැවිද්දෙන් නෙරපීම ආදියයි.

භික්ෂූන් වහන්සේ හා සම්බන්ධ ලංකාවේ පළමු වාර්තාගත පීඩාකාරී ක්‍රියාව වන්නේ භික්ෂු ඝාතනයකි. එය සිදුකොට ඇත්තේ ක්‍රි: පූ: 2වන සියවසේ දී කැලණියෙහි රජ කළ කැලණිතිස්ස රජතුමා විසිනි. එය අනියම් ප්‍රේම සම්බන්ධතාවයක වක්‍ර ප්‍රතිඵලයක් හේතුවෙන් සිදු වූවක් බව මූලාශ්‍රවලින් පැහැදිලිවෙයි. මහාවංසය වාර්තාකරන පරිදි

කැලණිතිස්ස රජුගේ සහෝදරයෙකු වූ උත්තිය කුමරා කැලණිතිස්ස රජුගේ බිසවක සමග රහස් සබඳතා පවත්වාගෙන යමින් සිට ඇත. කැලණිතිස්ස රජු එම කරුණ දැනගත් හෙයින් උත්තිය කුමරු කැලණි රාජ්‍ය තුළම කිසියම් ස්ථානයක සැඟව ගත්තේය. පෙර පරිදි අසම්මතයේ පෙම් බැඳී කුමරිය හමුවීමට වරම් අහිමි වූ ප්‍රේමයෙන් උන්මාද වූ උත්තිය කුමරු චර පුරුෂයෙකු ලවා එම කුමරිය වෙත හසුන් පතක් යැවීමට තීරණය කරයි. කෙසේ හෝ කුමරියට ලිපිය ගෙන ගොස් භාර දීමට පොරොන්දු වූ චරපුරුෂයා භික්ෂුවක වෙසින් රජමාලිගාවට ඇතුල්වීමට පහසු බව තේරුම් ගත්තේය. පසුව භික්ෂු වේශයක් ගත් ඔහු රජ ගෙදරට නිතර යමින් එමින් දන් වළඳන රහතන් වහන්සේ නමක සමග රජගෙට පිවිස ආහාර ගෙන එම තෙරුන් සමග නික්මෙන අවස්ථාවේදී දේවියට පෙනෙන ලෙස හසුන් පත බිමට හෙළීය. මෙය දුටු රජු එය කියවා බලා තම බිසව හා සොහොයුරු උත්තිය කුමරාගේ අසම්මත ප්‍රේමයට මෙම රහතන් වහන්සේ ද සහය දක්වන්නේ යැයි වැරදි නිගමනයකට පැමිණ එම තෙරුන් හා චීවරධාරී චරපුරුෂයා යන එම දෙදෙනාම මරවා මුහුදට දැමීය (මහාවංසය 1967: 22, 13-20). මෙම සිදුවීම රාජාවලියෙහි සඳහන්වන්නේ එම රහත් තෙරුන් තෙල්කටාරයක ලා පුළුස්සා මැරවූ බවය (රාජාවලිය 1997: 176). මෙම අවාසනාවන්ත සිද්ධිය හේතුකොට ගෙන මුහුද ගොඩ ගැලූ බව ද වංශකථාවෙහි සඳහන්ය. තේලකටාහ ගාථා රචනා වන්නේ ද මෙම කරුණ සම්බන්ධයෙනි.

සද්ධාතිස්ස (ක්‍රි:පූ: 137-119) රජුගේ අභාවයෙන් පසුව ඇමතිවරු මහා සංඝයාගේ අනුමතියෙන් ඔහුගේ බාල පුත්‍ර ථුල්ලත්ථන (ක්‍රි:පූ: 119) කුමරා රජකමට පත් කළහ. ඊට විරුද්ධ වූ ඒ වන විට රජයෙහි නියම උරුමකරුවා වූ ථුල්ලත්ථනගේ වැඩිමහල් සහෝදර ලජ්ජිතිස්ස කුමරා ඔහුව බලයෙන් නෙරපා හැර රටේ පාලකයා බවට පත්විය. ථුල්ලත්ථන කුමරා බලයට ගෙන ඒම සඳහා භික්ෂූන්වහන්සේලා උපකාර වූ හෙයින් ලජ්ජිතිස්ස රජු (ක්‍රි:පූ: 119 - 109) තුන් අවුරුද්දක් ම සංඝයා සමග අමනාපයෙන් පසු විය. එහි දී උන්වහන්සේලා නොසලකා හැරිය බව ද කියැවේ (මහාවංසය 1967: 33, 18-22). වෙනත් අනදරයක් කළ බවක් මහාවංසය වාර්තා නොකරන මුත්, මහතෙරවරුන්ට සුදුසු බත් ආදිය පළමුකොට නවක සඟුන්ට දීමෙන් මහ තෙරවරුන්ගේ සිත් රිදවීම් නැතහොත් මානසික හිංසනයකට ලක් කළ බව එම ක්‍රියාවලියෙන් පැහැදිලිවෙයි (මහාවංසය, 1967: 33, 22 - 23).

විභංග අටුවාවේ එන කථා වස්තුවකට අනුව වළගම්බා (ක්‍රි:පූ: 103, 89-77) රාජ්‍ය සමයෙහි සිදුවුණු බැමිණිටියා සාගතය අවස්ථාවේදී මිනීමස් කෑමට පුරුදුව සිටි මිනිස්සු පිරිසක් අනාගාමී තත්වයට පත්ව සිටි මහළු භික්ෂුවක් ඝාතනයකොට උන්වහන්සේගේ මස් අනුභව කළ බවක් වාර්තාවෙයි (සීලරතන හිමි 2014:77). මෙය ශෝචනීය මෙන්ම දුර්ලභ කරුණක් බව ද සඳහන් කළ හැකිය.

කණීරජානු තිස්ස (ක්‍රි:ව: 31-34) රාජ්‍ය සමයේදී ද භික්ෂූන් සමග හටගත් අර්බුදයක් හේතුකොට ගෙන රජතුමා විසින් හැටක් පමණ භික්ෂූන්වහන්සේලා චේතියගිරියෙහි (මිහින්තලයෙහි) කණීර පර්වතයෙන් හෙළා ඝාතනය කරනු ලැබිණි (මහාවංසය 1967: 35, 11). මෙය ලංකා ඉතිහාසයේ වාර්තාගත පළමු සමූහ භික්ෂු ඝාතනය ලෙස දැක්වීමට පුළුවන.

ගෝඨාභය රාජ්‍ය සමයේ දී (ක්‍රිːවː 253 - 266) භික්‍ෂු සාසනයට කිළුටක් වූ පාපකාරී භික්‍ෂූන්ට නිග්‍රහකොට භික්‍ෂූන් 60 නමක් පිට රටට පිටුවහල්කොට ඇත (මහාවංසය 1967ː 36, 110). මහසෙන් (274-301) රාජ්‍ය සමයෙහි දී සංඝමිත්‍ර නම් භික්‍ෂුවකගේ රැවටිලි බසින් මුලාව මහා විහාරීය භික්‍ෂූන් පෙළන ලද බව මහාවංශයෙහි සඳහන් ය. මලය දේශයට හා රුහුණු රටට එම ස්වාමීන්වහන්සේලා පැනයාම හේතුවෙන් වසර 9ක් මහාවිහාරය භික්‍ෂූන්ගෙන් ශූන්‍ය විය. මෙම අවස්ථාවේ දී ද මහාවිහාරීය භික්‍ෂූන් විවිධ තාඩන පීඩනවලට හා මානසික වධයට ලක් වූ බව සිතීමට පුළුවන.

තවත් භික්‍ෂු ඝාතනයක් වාර්තා වන්නේ ද මහසෙන් රාජ්‍ය සමයේදී ය. රජු හා එක්ව මහාවිහාරය විනාශ කළ ඉහත සඳහන් සංඝමිත්‍ර නම් භික්‍ෂුවගේ ක්‍රියා කලාපය නොරිස්සූ රජුගේ එක්තරා බිසවක විසින් වඩුවකුහට කහවණු දහසක අල්ලසක් දී සංඝමිත්‍ර නම් භික්‍ෂුව හා ඔහුට උපකාර කළ සෝණ නම් ඇමතිවරයා ද මරා දමන ලද බව මහාවංශයෙහි සඳහන් වේ (මහාවංශය 1967ː 37, 28). අල්ලස් දී මනුෂ්‍ය ඝාතන සිදුකිරීම අතීතයේදී ද පැවති බවට මෙය කදිම සාක්‍ෂියකි. අනෙක් අතින් සම කාලීන කාන්තාවගේ භූමිකාව පිළිබඳ අදහසක් ලබා ගැනීමටත් මෙම සිදුවීම බෙහෙවින් උපකාර වේ.

එසේම මහසෙන් රාජ්‍ය සමයේදී භික්‍ෂූන්ට සිදු වූ තවත් පීඩාකාරී සිද්ධියක් වූයේ මහාවිහාර සීමාව තුළ ජේතවනාරාමය පිහිටුවීම වන අතර එම අවස්ථාවේදී මහා විහාරය සමග ඇති වූ ගැටුමක් වංශකථාවල දීර්ඝව සඳහන්ව ඇත. මහාවිහාර සීමාව තුළ වූ ජේතවන උයනෙහි ජේතවන විහාරය පිහිටුවීමට රජු මහාවිහාරීය භික්‍ෂූන්ගෙන් එම සීමාව වෙන්කර දෙන ලෙස ඉල්ලීම් කළ ද එම ස්වාමීන්වහන්සේලා එය ප්‍රතික්ෂේප කළහ. රජුගේ ඉල්ලීමට භික්‍ෂූන්වහන්සේලා දක්වූ ප්‍රතිචාරය මහාවංශයෙහි මෙසේ වාර්තාකර ඇත.

මේ මහාවිහාරයෙහි සීමා ඉගිලවීම අපට රිසි නොවේ. අපට යුතු ද නොවේ. එසේම මහරජ ඔබට ද එය රිසි නොවේවා. ඔබට ද මෙය නොවටනේය (මහාවංසය 1956ː 37, 37). නිකාය සංග්‍රහයෙහි මෙම කරුණ වාර්තාකර ඇත්තේ එකල්හී මහ වෙහෙර වසන භික්‍ෂූහු ඇතුළු සිමැ නා නා සංවාසකයන්ට විහාර කළ නොහැක්කැයි වළක්වා ---- යනුවෙනි (නිකාය සංග්‍රහය 1987ː 25). මෙම ගැටුම හේතුකොට ගෙන බොහෝ මහාවිහාරීය භික්‍ෂූන් වහන්සේලා මහාවිහාරය අතහැර රුහුණට පළා ගියහ. එහෙත් භික්‍ෂූන් වහන්සේලා කීප නමක් මහාවිහාරය තුළ සැඟව සිටිමින් ජේතවන සීමාවන් සලකුණු කළ අවස්ථාවන්හි දී සීමා කණු රහසිගතව ගලවා දැමූ බව කියැවේ (මහාවංසය 1967ː 37, 37). නිකාය සංග්‍රහයට අනුව මෙම අර්බුදයට රහතන් වහන්සේලාත් සිතුල්පවු විහාරයේ වාසය කළ අභිඥානලාභී හෙරණ කෙනෙකුත් මැදිහත් වී ඇත. මෙම අභිඥානලාභී භික්‍ෂුව රාක්‍ෂස වේෂයක් මවා යගදාවක් ද අතින් ගෙන ජේතවන භික්‍ෂු පිරිස මැදට පැන උන්වහන්සේලා බියකර පලවා හැරීමට කටයුතු කර ඇත (නිකාය සංග්‍රහය 1987ː 26). ඉහත කරුණුවලින් පෙනෙන්නේ මහසෙන් රජු මහාවිහාරීය භික්‍ෂූන්වහන්සේලා මහත් පීඩාවකට ලක් කළ බවය. කෙසේ වෙතත් පසුව ජේතවන විහාරය පිළිගත් තිස්ස තෙරුන් විවිධ චෝදනා ලැබීම හේතුවෙන් නීති විනිශ්චයකින් පසුව රජුගේ නොකමැත්ත පිට ම සිවුරු හරවා යැවූ බව මහාවංශය වාර්තා කරයි (මහාවංසය 1967ː 37, 39).

සලමෙවන් (623 - 632) රාජ්‍ය සමයේ දී බෝධි නම් භික්ෂුවක් අභයගිරි විහාරයෙහි වාසය කරන භික්ෂූන්ගේ දුසිල්බව දැන සංඝ සංශෝධනයක් කරන ලෙස රජුගෙන් ඉල්ලීමක් කර ඇත. එම ක්‍රියාවේ ප්‍රතිඵලයක් ලෙස දුසිල් භික්ෂු පිරිසක් සසුනෙන් නෙරපූහ. පසුව ඔවුන් එක්ව බෝධි නම් එම ධාර්මික භික්ෂුව මරා දැමූහ (මහාවංසය 1967: 42, 75-77). මෙය දැනගත් රජු කෝපයට පත්ව එම පිරිස අල්ලා ඔවුන්ගේ අත් පා කපා බැඳ දමා පොකුණු ආරක්ෂකයන් බවට පත් කළ අතර එම විනිශ්චයෙන් වරද කරුවන් වූ තවත් භික්ෂූන් 100 නමක් දඹදිවට පිටුවහල්කොට ඇත (මහාවංසය 1967: 42, 78,79). එම විශෝධනයෙන් පසු එම රජු විසින් ථේරීය භික්ෂූන් වහන්සේලාට අභයගිරි භිෂූන් සමග පොහොය කර්ම කරන ලෙස ඉල්ලීමක් කර ඇතත් ඊට එකඟ නොවූ ථේරීය භික්ෂූන් කෙරෙහි බොහෝ කිපී අනාදරයෙන් ආක්‍රෝෂකොට පරුෂ බසින් බැන වැදුණු බව මහාවංසය වැඩි දුරටත් වාර්තා කරයි (මහාවංසය 1967: 42, 80,81).

හත්ථදාඨ හෙවත් 2වන දාඨෝපතිස්ස රජු (659-667) සැදැහැයෙන් තොරව අලාභ කරමින් භික්ෂූන්ට ආක්‍රෝෂ කළ හෙයින් උන්වහන්සේලා රජ මාලිගාව ඉදිරියේදී පාත්‍රය මුණින් හැරවීම හෙවත් පත්ත නික්කුජ්ජන කර්මය කළහ (මහාවංසය 1967: 43, 31-35). ධාතුසේන (455 - 473) රජු කුමාර කාලයේ දී පැවිදිව සිටි අතර එක් යතිවරයෙක් මෙම සාමණේර හිමි සමග කිසියම් කරුණකින් උරණව උන්වහන්සේගේ හිසට කැළි කසල දැමූ බව මහාවංසය වාර්තා කරයි. කෙසේ වෙතත් ධාතුසේන සාමණේරයන් වහන්සේ ඉන් කිපීමට ලක්ව නැත (මහාවංසය 1967: 38, 19). මෙය භික්ෂුවක් විසින් තවත් භික්ෂුවක් පෙළන ලද අවස්ථාවක් ලෙස දැක්වීමට පුළුවන. ධාතුසේන භික්ෂුව පසු කලෙක උපැවිදිව රාජ්‍යත්වයට පත්වූ අතර ඔහු විසින් ජනතා සුභ සිද්ධියට හේතුවන කෘෂිකාර්මික කටයුතු බොහොමයක් සිදු කරනු ලැබිණි. මෙසේ කෘෂි කාර්මික සංවර්ධන කටයුතු අරමුණුකොට කලා වැව නිර්මාණය කරන අවස්ථාවෙහි දී එම භූමියෙහි සමාපත්තියකට වැද වැඩ සිටි එක් භික්ෂූන් වහන්සේ නමක් එම ස්ථානයෙන් ඉවත් නොවී එම ස්ථානයෙහිම වැඩසිට ඇත. එහිදී උන්වහන්සේ මත පස් හෙළූ බව මහාවංසයෙහි සඳහන්ය (මහාවංසය 1967: 38, 113). එම ඝාතනයෙහි ප්‍රතිවිපාකයක් ලෙස රජුට ද දිට්ඨ ධම්මවේදනීය වශයෙන් එබඳුම වූ මරණයක් උරුම වූ බව මහාවංසයෙහි වැඩි දුරටත් වාර්තා කර ඇත.

1 වන අග්ගබෝධි (ක්‍රි: 575-608) රාජ්‍ය සමයේ දී දාඨාපභූති නම් ඇපාවරයෙකු ජෝතිපාල නම් තෙර කෙනෙකු හා ධර්ම කරුණු සම්බන්ධ හටගත් ගැටුමක් අවස්ථාවේ දී උන්වහන්සේට පහර දීමට ඇපාවරයා උත්සාහ කළේය. එකෙනෙහිම අතෙහි හටගත් ගඩුවක් හේතුවෙන් එය වැළකී ගිය බව ද මහාවංසය වාර්තා කරයි (මහාවංසය 1967: 41 35). 3 වන උදය රජුගේ සමයෙහි දී (935 - 938) කිසියම් හේතුවකින් රජු සමග ආරවුලක් ඇතිකර ගත් ඇමතිවරු පිරිසක් රජු කෙරෙහි බියපත්ව තපෝවනයට වැදුනහ. එවිට සේනා නම් උප රජ එහි ගොස් එම ඇමතිවරුන්ගේ හිස් සිඳ දැමූහ. මෙම අකටයුත්තෙන් සිත් තැවුලට පත් එම වනවාසී භික්ෂූහු එම ආරාම අතහැර රුහුණට වැඩම කළහ. පසුව උන්වහන්සේලා කමා කරවාගෙන ආපසු වඩමවා ගැනීමට රජතුමා සමත්විය (මහාවංසය 1967: 51 14 - 27).

පොළොන්නරු රාජ්‍ය සමයෙහිදී මහා පරාක්‍රමබාහු (1153-1186) රජු විසින් දුසිල් පැවිද්දන් ශාසනයෙහි උන්නතියට බාධාවක් ලෙස සලකා ඔවුන් සියළු දෙනා සිවුරු හරවා විවිධ තනතුරු දී යැවූ බව සඳහන් ය (මහාවංසය 1967: 76, 19). නිශ්ශංකමල්ල රජුට අයත් රුවන්වැලි සෑ පුවරු ලිපියෙහි දුසිල් පැවිද්දන් හට සසුන කිළිටි

නොකොට සිවුරු හැර යන්න ලෙස ආරාධනා කරන අතර එසේ උපැවිදිවන්නන් හට රන්, වස්ත්‍ර, යකඩ, කුඹුරු, හරක් ආදී දේ දෙන ලද බව ද සඳහන්කර ඇත (අමරවංශ හිමි 1969: 382). එබැවින් එම සමයෙහි දී භික්ෂු සාසනය තුළ යම් අර්බුදකාරී තත්‍වයක් පැන නැගී තිබුණු බව පැහැදිලි වෙයි. පොළොන්නරු යුගයෙහි අවසන් සමයෙහි ලංකාව ආක්‍රමණය කළ මාඝ (1215-1236) විසින් බොහෝ වෙහෙර විහාර විනාශ කරමින් පස් සහදැමියන් හෙවත් භික්ඛු, භික්ඛුණී, සාමණේර, සාමණේරී, සහ සික්ඛාමානා යන පිරිස් බොහෝ සේ පීඩාවට පත් කරනු ලැබිණි (මහාවංසය 1967: 78, 60-69). දඹදෙණියෙහි දෙවන පරාක්‍රමබාහු (1236-1270) රාජ්‍ය සමයෙහි දී මිත්‍යා ආජීවයට පැමිණ සන්සුන් නොවූ ඉඳුරන් ඇතිව සිටි දුසිල් මහණුන් සිවුරු හරවා සාසනයෙන් පිටමංකරණු ලැබිණි (මහාවංසය 1967: 82, 1-9).

කෝට්ටේ සමයේ දී අලගක්කෝනාර ප්‍රභූරාජයා විසින් ද ශාසනයේ උන්නතිය වෙනුවෙන් භික්ෂූන් රැස්කරවා පරීක්ෂාකොට දුශ්ශීලයන් සිවුරු හරවා යවා ඇත (මහාවංසය 1967: 99, 10). 6වන බුවනෙකබාහු (1470-1478) රාජ්‍ය සමයේදී සිංහල සංගය නම් කැරැල්ලට මූලිකත්‍වය දුන් කුරගම නම් හිමියන් දඟ ගෙයි දමනු ලැබ ඇත (රාජාවලිය 1997:220). එය රාජ්‍ය ද්‍රෝහී ක්‍රියාවක් වුව ද සිංහල සංගයට සම්බන්ධ අය සඳහා 6වන බුවනෙකබාහු රජු විසින් අභය දුන්බව දැදිගම පුවරු ලිපියෙහි ද සඳහන්ව තිබීම විශේෂත්‍වයකි (විමලකිත්ති හිමි 1957: 171).

සීතාවක 1වන රාජසිංහ (1582-1593) රාජ්‍ය සමයෙහි භික්ෂූන් හා උරණ වූ රජු ශිව භක්තිය වැළඳගෙන ශාසනය විනාශ කරමින් භික්ෂු සංඝයා මරවමින් ධර්ම පුස්තක ගිනි තබමින් ආරාම කඩා බිඳ දමමින් කටයුතු කළ බව මහාවංශයෙහි සඳහන් ය. රජුගෙන් ඇති වූ භය නිසා ඇතම් භික්ෂූහු සිවුරු හැර ගිය අතර තවත් පිරිසක් ආරක්ෂිත ස්ථානයන්හි සැඟව ගත්හ (මහාවංසය 1967: 91, 7-17). මෙම කරුණ මන්දාරම්පුර පුවත ද වාර්තාකර ඇත්තේ මෙසේ ය.

| | |
|---|---|
| මහ බෝ වෙහෙර පුද උන් උදුරා | ගනිත |
| සිල්වත් සඟන මරවත බුදු රුව | කඩත |
| පොත් ගිනි ලත අනගි විසිතුරු දේ | නසත |
| වැසියන් පෙලත උන් සතු දේ හැර | ගනිත |

(මන්දාරම්පුර පුවත 1996: 65 කවිය)

මේ හැර ඔහුගේ සමයේ දී රජුට විරුද්ධව කටයුතු කළ සංඝයා වහන්සේලා 121 නමක් මරාදමන ලද බවත් එම විහාර සියල්ල ද දවා අළු කළ බවත් මන්දාරම්පුර පුවතෙහි වාර්තා වී ඇත (මන්දාරම්පුර පුවත 1996: 65 කවිය). ජනප්‍රවාදයෙහි සඳහන් වන්නේ එම භික්ෂූන් වහන්සේලා දෙදෙනා බැගින් එකට ගැට ගසා සීතාවක ගඟෙහි ගිල්වා මරන ලද බව ය. දෙවන රාජසිංහ (1635-1687) රජුගේ සමයේ දී ද ඔහුට විරුද්ධව කටයුතු කළ භික්ෂූන්වහන්සේලා රජුගේ නියෝගය මත හිස ගසා සිරුර ගඟට දැමූ බව රොබට් නොක්ස් වාර්තා කර ඇත (නොක්ස් 2004: 101).

ශ්‍රී වීරපරාක්‍රම නරේන්ද්‍රසිංහ (1707-1739) රාජ්‍ය සමයේ දී එම රජු විසින් සූරියගොඩ තෙරුන් හා ඇතිවුණු විරසකයක් හේතුවෙන් උන්වහන්සේ ඝාතනය කොට විහාර සන්තක සියළු දෙය වෙනත් පාර්ශ්වයකට පවරා දෙනු ලැබ ඇත. සූරියගොඩ

තෙරුන් වැලිවිට සරණංකර හිමියන්ගේ ද ගුරුවරයා ය. වෙනත් කරුණක් පදනම්කොට සරණංකර සාමණේරයන් ඇතුළු සිල්වතුන් පිරිසක් දඬුවමක් ලෙස ලග්ගලට පිටුවහල් කිරීමට ද එම රජු ක්‍රියාකොට ඇත. නැවත රජු හා මිත්‍රත්වයට පත් සරණංකර හිමියන් රජුගේ කුළුපග මිතුරෙකු වී ඇති අතර මෙය නොරිස්සූ ගොන්සාල්වේස් නම් ක්‍රිස්තියානි පූජකවරයා සරණංකර හිමියන්ට වස දී ඝාතනය කිරීම සඳහා උත්සාහගත් බව මන්දාරම් පුවතෙහි වාර්තා වී ඇත (මන්දාරම් පුවත 1996: 499 කවිය).

කීර්ති ශ්‍රී රාජසිංහ සමයේදී ද රජතුමා ඝාතනය කිරීමේ කුමන්ත්‍රණයකට සරණංකර හිමියන් සම්බන්ධ යැයි සිතූ බැවින් සරණංකර හිමියන් හා තිබ්බටුවාවේ සිද්ධාර්ථ බුද්ධරක්ඛිත හිමි කලක් කුරුණෑගල සිරකොට තැබීය. මෙම සිද්ධියට ම සම්බන්ධ සියම් හිමිවරු කීප නමක් මැරීමට තීරණය කළ ද මීගස්තැන්න අධිකාරම්ගේ මැදිහත් වීමෙන් එය වැළකී ගිය අතර උන්වහන්සේලා නගරයෙන් පන්නා දමා ඇත. එම භික්ෂූන් ආහාර නොමැතිව ක්ලාන්තව වී ඇති අතර දලුක් ගස්වල කිරි බීම හේතුවෙන් ලේ වමනය කොට මියගිය බව ශාසනාවතීර්ණ වර්ණනාවෙහි වාර්තා වී ඇත (ශාසනාවතීර්ණ වර්ණනාව 1956: 25).

1816 වර්ෂයේ දී බ්‍රිතාන්‍යයන්ට විරුද්ධව කටයුතු කළ ඉහගම උන්නාන්සේ සහ පොද්දෙල්ගොඩ හා කපුලියැද්දෙ නම් වූ භික්ෂූන් තුන් නමක් බ්‍රිතාන්‍ය පාලකයන් විසින් අත් අඩංගුවට ගන්නා ලදහ. මෙයින් ඉහගම උන්නාන්සේ අත් අඩංගුවෙන් පැනයන අතර අනෙක් දෙනම සිරගතකරන ලදී. පසුව ඉහගම හිමි සුද්දන්ගෙන් බේරීමට සිවුරු අත්හරින ලද අතර 1818 කැරල්ලට ද සම්බන්ධ විය. කැරැල්ල අසාර්ථක වීමෙන් පසු අත්අඩංගුවට පත්වන ඔහු මුලින් මරණීය දණ්ඩනයට ලක් වුව ද පසුව එම දඬුවම ලිහිල්කොට මුරිසි දිවයිනට පිටුවහල්කොට ඇත (සිංහල විශ්වකෝෂය 1970: 313).

1815 මාර්තු 2වන දින උඩරට ගිවිසුම කියවන අවස්ථාවේදී ඉහළට එසැවුණු ඉංග්‍රීසි කොඩිය අභීත ලෙස පහත හෙළූ මල්වතු පාර්ශ්වයේ අනුනායක වාරියපොළ සුමංගල හිමියන් දළදාව පැහැර ගනිමින් 1818 කැරල්ලට ද සහය පළ කළ හෙයින් 1818 නොවැම්බර් 1 වන දා මාතලේ දී අත්අඩංගුවට ගෙන යාපනය බන්ධනාගාරයෙහි සිරකොට තබා ඇත. උන්වහන්සේ නැවත නිදහස ලබා ඇත්තේ 1821 අප්‍රේල් 13 වන දා බව ද කියැවේ (සීලකඛන්ධ හිමි1989: 11-19).

1848 වර්ෂයේ දී ඉංග්‍රීසි පාලනයට විරුද්ධව දඹුලු විහාරයේ විහාරාධිපති ගිරානේගම ඉන්දජෝති හිමියන්ගේ ප්‍රධානත්වයෙන් කැරැල්ලක් ආරම්භ කළ අතර ඔවුන්ගේ බලාපොරොත්තුව වූයේ ගොන්ගාලේගොඩ බණ්ඩා රජකමට පත්කොට ලංකාව ඉංග්‍රීසීන්ගෙන් මුදාගැනීම ය. වීරපුරන්අප්පු ද මෙහි ප්‍රධාන නායකයෙකු විය. එම කැරැල්ල අසාර්ථක වී ගිය අතර ගිරානේගම ඉන්දජෝති ඇතුළු තවත් භික්ෂූන් 16 නමක් හිරකරුවන් බවට පත් වූ අතර කඩහපොළ උන්නාන්සේ හෙවත් කුඩාපොළ හිමියන් 1848 අගෝස්තු 26 වන දා වෙඩි තබා ඝාතනය කරන ලදී (ඇටඹගස්කඩ 1984: 273 - 285). උන්වහන්සේ ග්‍රාමීය ජනතාවට බෙහෙවින් උදව් උපකාර කළ ජනතාවගේ සිත් දිනාගෙන සිටි භික්ෂූන් වහන්සේ නමක් වූ අතර උක්ත 48 කැරැල්ලට සෘජු සම්බන්ධතාවක් නොමැති භික්ෂූන්වහන්සේ නමක් වශයෙන් ද පිළිගැනීමක් පවතියි. එම භික්ෂු ඝාතනයෙන් පසු බ්‍රිතාන්‍ය පාලකයන් විසින් භික්ෂු ඝාතනයක් හෝ උන්වහන්සේලා ප්‍රබල පීඩනයකට ලක් කළ බවට සාධක නැත. මිහින්තලය, අනුරාධපුර අටමස්ථානය ආදියෙහි සුළු ඉඩම් ආරවුල් කීපයක් හැර ලාංකේය භික්ෂූන්වහන්සේ සහ බ්‍රිතාන්‍ය

පාලකයින්ගෙන් 1948 වර්ෂයෙහි නිදහස ලබන තෙක් සුහදශීලීව කටයුතු කරගෙන ගිය බව පෙනී යයි.

1948 ලංකාව බ්‍රිතාන්‍ය පාලනයෙන් මිදුනු තැන් පටන් මේ දක්වා ද විශාල භික්ෂු පිරිසක් ඝාතනයට ලක්වූහ. දේශපාලනික හා වර්ගවාදී හේතු පෞද්ගලික කෝන්තර මෙහිදී මුල්තැනක් ගෙන ඇත. කොටි ත්‍රස්තවාදීන්ගේ ක්‍රියාකාරකම්, ජනතා විමුක්ති පෙරමුණෙහි ක්‍රියාකාරකම්, සහ පැවති රජයන්ගේ මර්දනකාරී ක්‍රියාකාරකම් මේ සඳහා හේතු වූ බව හඳුනාගත හැකි ය. මෑත සමයෙහි සිදු වූ වඩා බේදනීය හා ආන්දෝලනාත්මක දේශපාලනික හා වර්ගවාදී භික්ෂු ඝාතනය වූයේ කොටි ත්‍රස්තවාදීන් විසින් 1987 ජුනි මස 2වන දින අම්පාර අරන්තලාවේ දී සිදු කළ ඝාතනයයි. මෙහි දී අම්පාර ශ්‍රී විද්‍යානන්ද පිරිවෙනෙහි අධිපති උතුරු නැගෙනහිර දෙපළාතෙහි අධිකරණ සංඝනායක හැගොඩ ඉන්දසාර නාහිමියන් ඇතුළු ලොකු කුඩා භික්ෂූන් වහන්සේලා 31 නමක් අමානුෂික අයුරින් කපා කොටා ඝාතනය කෙරුණි. උන්වහන්සේලා පහත අයුරු වෙයි.

| | |
|---|---|
| පූජ්‍ය පරගහකැලේ විජිත නන්ද හිමි | වයස 24 |
| පූජ්‍ය කළුගල ආනන්ද සාගර හිමි | වයස 19 |
| පූජ්‍ය වාවින්නේ සද්ධාවංශ හිමි | වයස 19 |
| පූජ්‍ය කෙසෙල්පොත සුගත පාල හිමි | වයස 18 |
| පූජ්‍ය තල්ගමුවේ උපරතන හිමි | වයස 18 |
| පූජ්‍ය වාවින්නේ සද්ධාතිස්ස හිමි | වයස 18 |
| පූජ්‍ය වාවින්නේ ගුණවංශ හිමි | වයස 17 |
| පූජ්‍ය වාවින්නේ අත්ථදස්සි හිමි | වයස 17 |
| පූජ්‍ය මහියංගනයේ ගුණසෝම හිමි | වයස 17 |
| පූජ්‍ය කුරුපනාවල කෝලිත හිමි | වයස 17 |
| පූජ්‍ය මන්ත්‍රීතැන්නේ ධම්මදස්සි හිමි | වයස 16 |
| පූජ්‍ය කෝමාරියේ විමලජෝති හිමි | වයස 15 |
| පූජ්‍ය හඳුන්ගමුවේ අරියවංශ හිමි | වයස 15 |
| පූජ්‍ය දඹරාවේ මහින්ද හිමි | වයස 15 |
| පූජ්‍ය අඹගහ වැල්ලේ සරණ හිමි | වයස 14 |
| පූජ්‍ය කොටවෙහෙර විමල බුද්ධි හිමි | වයස 14 |
| පූජ්‍ය කුරුණෑගල පඤ්ඤානන්ද හිමි | වයස 14 |
| පූජ්‍ය කුරුපනාවල ධම්මපාල හිමි | වයස 13 |
| පූජ්‍ය හඳුන්ගමුවේ බුද්ධරක්ඛිත හිමි | වයස 13 |
| පූජ්‍ය රජගලතැන්නේ පුණ්‍යජී හිමි | වයස 13 |
| පූජ්‍ය දේවාලහිඳ ධම්මරක්ඛිත හිමි | වයස 12 |

| | |
|---|---|
| මහියංගනයේ වජිරබුද්ධි හිමි | වයස 12 |
| මහියංගනයේ සුමන හිමි | වයස 12 |
| තෙරිපැහැ සෝභිත හිමි | වයස 12 |
| වාවින්නේ විජිත හිමි | වයස 11 |
| මහියංගනයේ ආනන්ද හිමි | වයස 11 |
| මහියංගනයේ විපුලසාර හිමි | වයස 11 |
| රාගල ආනන්ද හිමි | වයස 11 |
| දේවාලහිඳ අනෝමදස්සි හිමි | වයස 10 |
| කළුගල පාලිත හිමි | වයස 9 |

එසේම උතුරු නැගෙනහිර පළාතේ ජන ජීවිතය නගාසිටුවීමට මහත් කැපවීමකින් කටයුතු කළ දිඹුලාගල හාමුදුරුවෝ හෙවත් කිතලගම සීලාලංකාර නම් වූ සංඝ පීතෘන්වහන්සේ 1996 මැයි මස 26වන දින ත්‍රස්තවාදීන් විසින් ඝාතනය කෙරුණි. මේ හැර උතුරු පළාතේ කොක්වෙල්ලියේ බෝධිමළු විහාරාධිපති දික්වැල්ලේ මහානාම හිමියන් කොටි ත්‍රස්තවාදීන් විසින් (1986 දී පමණ) පැහැරගෙන ගොස් අතුරුදහන් කරන ලදී. ගෝනමැරියාව රජමහවිහාරයෙහි විහාරාධිපති දුටුවැවේ චන්ද්‍රානන්ද හිමියන් ද කොටි ප්‍රහාරයකට මැදිව අපවත් වූහ. උතුරු මැද පළාතේ ඉතා ක්‍රියාකාරීව ආගමික හා සමාජ කටයුතු කරමින් සිටි සිරිපුර රජමහ විහාරාධිපති පිහිඹියගොල්ලෑවේ ධම්මාලෝක හිමියන් සහ එම විහාරවාසී කාවන්තිස්සපුර සද්ධාතිස්ස හිමියන් ද 2001 නොවැම්බර් 18වන දින හිරල්ලුගමදී කොටි බෝම්බයක් පුපුරවා හැර ඝාතනය කළහ. (වව්නියාව සියඹලාගස්වැවේ විමලසාර හිමි සමග කළ සාකච්ඡාවෙන්) මේ සමයෙහි දී ම තන්තිරිමලයේ රජමහාවිහාරාධිපති කුඩාකෝන්ගස්කඩ විමලඥාන හිමියන් ද බෝම්බ ප්‍රහාරයකින් අපවත් වූ අතර එය කොටි ප්‍රහාරයකින් වූයේ ද නැතහොත් වෙනත් කණ්ඩායමක් විසින් ඝාතනය කරන ලද්දේ දැයි පැහැදිලි නැත. 1985 වර්ෂයෙහි මැයි මස 14 වන දින ශ්‍රී මහා බෝධියට කළ ප්‍රහාරයෙන් එක් ස්වාමීන්වහන්සේ නමක් හා සිල්මැණිවරු දෙදෙනෙකු අපවත් වූහ (විජයදාස 2007: 109). වව්නියාව සියඹලාගස්වැවේ විමලසාර හිමියන් ද දින කීපයක් කොටි අත්අඩංගුවේ පසු වූ අතර පසුව නිදහස් විය. ත්‍රිකුණාමලය වෙල්ගම් වෙහෙර විහාරස්ථානයෙහි විහාරාධිපති පූජ්‍ය අංපිටියේ ශීලවංශ තිස්ස නා හිමියන්ට 1985 වර්ෂයේදීත් 2000 වර්ෂයේදීත් කොටි ත්‍රස්තවාදීන් විසින් එල්ලකරන ලද ප්‍රහාරවලින් උන්වහන්සේ දැඩි ලෙස රෝගාතුර වූහ (ශීලවංශ තිස්ස හිමි 2012: 40). සාම පා ගමනක යෙදී සිටි ජපන් ස්වාමීන්වහන්සේ නමක් ද කොටි ත්‍රස්තවාදින් විසින් යාපනය වැල්වැටිතුරේ දී ඝාතනය කරන ලදී. මේ හැර තිරප්පන්මඩුව, නෙලුක්කුලම, ට්‍රැක් 7, වාරුකොට්ටෝරුව, කිළිනොච්චියේ ලුම්බිණි විහාරය ආදී විහාරස්ථාන රැසක් ගිනිබත් කිරීම හෝ පූර්ණ වශයෙන් විනාශ කළ අතර ඒවායේ වැඩසිටි ස්වාමීන් වහන්සේලා වෙනත් ස්ථානවලට පැනගොස් ජීවිත බේරා ගත්හ.

දේශපාලන වශයෙන් ගත් කල 1971 වර්ෂයේ දී ජනතා විමුක්ති පෙරමුණ හා සම්බන්ධයෙන් හටගත් කැරලිකාරී අවස්ථාවේ දී රටේ විවිධ ප්‍රදේශවල භික්ෂූන් වහන්සේලා 50 නමක් පමණ රජයේ නිළලත් හමුදාවෙන් හා නිළ නොලත් කණ්ඩායම්

විසින් ඝාතනය කරන ලදැයි සැලකේ. එසේම 1987 හා 1990 අතර සමයේ දී ජනතා විමුක්ති පෙරමුණට හිතවත්ව කටයුතු කළ විශේෂයෙන් තරුණ භික්ෂූන් වහන්සේලා පන්සියයකට නොඅඩු ගණනක් ඝාතනය කෙරුණි. (උන්වහන්සේලා පිළිබඳ ඉදිරියේ දී තොරතුරු සොයා බැලීමට අපේක්ෂිතය)

ජනතා විමුක්ති පෙරමුණ හෝ ඊට සම්බන්ධ දේශප්‍රේමී ජනතා ව්‍යාපාරය වැනි කණ්ඩායම් විසින් ඝාතනය කළ බව කියැවෙන භික්ෂූන් වන්සේලා පිරිසක් ද වෙති. එසේ ඝාතනය කිරීමට ප්‍රධාන හේතුව වී ඇත්තේ උන්වහන්සේලා රජය සමග සම්බන්ධ වී කටයුතු කිරීම හෝ එක්සත් ජාතික පක්ෂයට හිතවාදී යම් යම් ක්‍රියාකාරකම් කිරීම බව කියැවෙයි. මෙසේ සිදු වූ පළමු භික්ෂු ඝාතනය ලෙස හඳුනාගත හැක්කේ වාද්දුව කවුඩුදූව විහාරස්ථානයෙහි විහාරාධිපති පොහොද්දරමුල්ලේ පේමාලෝක හිමියන්ගේ ඝාතනයයි. එය 1988 දෙසැම්බර් 21 වන දින සිදුවී ඇත. උන්වහන්සේ ඊට පෙර කැලණියේ දී බෝම්බ ප්‍රහාරයකට ද ලක්වූහ. ලංකාවේ චිරප්‍රසිද්ධ ධර්ම කථිකයාණන්වහන්සේ නමක් වූ කොටිකාවත්තේ සද්ධාතිස්ස හිමියන් 1989 අගෝස්තු 3 වන දින වෙඩිතබා ඝාතනය කළහ. මේ අතර ගුරුවරයෙකු වශයෙන් සේවය කරමින් සිටි හෝමාගම හබරකඩ ධර්ම විජයශ්‍රාමාධිපති වල්ලඹගල පඤ්ඤාසාර හිමියන් 1989 අගෝස්තු 13වන දින වෙඩිතබා ඝාතනය කරන ලදී. මාතර වැල්ලේතොට විහාරයෙහි විහාරාධිපති වැල්ලේතොට පඤ්ඤාදස්සි හිමියන් ද 1989 අගෝස්තු 9වන දින ඝාතනය කෙරුණි. මිද්දෙනිය පුරාණ විහාරයෙහි විහාරාධිපති බෙලිගල්ලේ මහින්ද හිමියන් 1989 මැයි 28වන දින ඝාතනයට ලක් වූහ. කුරුණෑගල කොරොස්ස විහාරවාසී රුද්දගොඩ සරණංකර හිමියන් ද 1989. 7. 25 දින ඝාතනය කෙරුණි. 1951 වර්ෂයේ දී උපත ලද උන්වහන්සේ අලකොළමුල්ල ධම්මාධාර පිරිවෙනෙහි අචාර්යවරයෙකු වශයෙන් ඒවන විට සේවය කරමින් සිටියහ. තව ද චිරප්‍රසිද්ධ ලේඛකයෙකු හා ආසියා බෞද්ධ කලා පර්යේෂණ මණ්ඩලයේ සභාපති ධුරය ද දැරූ පර්යේෂකයෙකු වූ බූන්දල ලේඛක තපෝවනයෙහි අධිපතිව සිටි තිරාණගම රතනසාර හිමියන් 1989 සැප්තැම්බර් 30වන දින වෙඩි තැබීමෙන් ඝාතනයට ලක් වූහ. අනුරාධපුර කලාඹය විහාරස්ථානයෙහි විහාරාධිපති කහවේ විමලසිරි නායක ස්වාමීන්වහන්සේ (1989 විය හැකිය) ඝාතනය කළහ. උන්වහන්සේ ප්‍රදේශයේ කෘෂිකාර්මික කටුයුතු සංවර්ධනයට විශාල දායකත්‍වයක් සැපයූ ස්වාමීන්වහන්සේ නමක් ලෙස සැලකේ. තව ද හොරණ බුලත්සිංහල පාහියන්ගල විහාරාධිපති යටගම්පියේ සරණසිරි හිමියන් ද 1989 වර්ෂයේ දී වෙඩිතබා ඝාතනය කළහ. උන්වහන්සේ ද ගමෙහි ජනතාව සමග සමීපව කටයුතු කළ ස්වාමීන්වහන්සේ නමකි. අඹන්පොළ කිරිමැටියාව ඇඹුල්ගිරිය රජමහවිහාරාධිපති එරියාවේ පඤ්ඤාලෝක හිමි 1989. 8. 25 වන දින ඝාතනයට ලක් වූහ. අනුරාධපුර දොරමඬලාව රජමහවිහාරාධිකාරී ස්වාමීන්වහන්සේ ලෙස කටයුතු කරමින් සිටි නාමල්වැවේ ගුණරතන හිමියන් 1989 වර්ෂයේ දී ඝාතනය විය. 1987 සිට 1992 අතර කාලයේ දී ජනතා විමුක්ති පෙරමුණ හෝ එබඳු පිරිස් විසින් ලංකාවේ විවිධ පළාත්වල වැඩවාසය කළ විවිධ තරාතිරම්වලට අයත් භික්ෂූන් වහන්සේලා 30 නමක් පමණ ඝාතනය කළ බව විශ්වාස කෙරේ. මින් ඇතැම් ඝාතන පිළිබඳ විවිධ සැක මතුව පවතින බවද සඳහන් කළ යුතු ය. මීට අමතරව පෞද්ගලික කෝන්තර මත හා සොර සතුරන්ගේ ක්‍රියාකාරකම් හේතුවෙන් ඒ ඒ අවස්ථාවන්හි දී ඝාතනයට ලක් වූ ලාංකේය භික්ෂූන් වහන්සේලාගේ ප්‍රමාණය විශාල ය. ප්‍රාදේශීය වශයෙන් සිදු වූ එම ඝාතන පිළිබඳ තොරතුරු සොයා ගැනීම ඉතා දුෂ්කර වේ.

## ආශ්‍රිත ග්‍රන්ථ


ඇටඹගස්කඩ, ආර්. (1984) ඓතිහාසික මාතලේ, සංස්: මාතලේ සාසනතිලක නා හිමි ඇතුළු පිරිස, මාතලේ දිසා සංස්කෘතික මණ්ඩලයේ ප්‍රකාශනයකි.

නිකාය සංග්‍රහය, (1987) සංස්: එල් ගුණරත්න, රත්න පොත් ප්‍රකාශකයෝ, කොළඹ.

නොක්ස්, රොබට්. (2004) එදා හෙළදිව පරිවර්තනය: ප්‍රෙමචන්ද්‍ර අල්විස්, සූරිය ප්‍රකාශකයෝ, කොළඹ.

මන්දාරම්පුර පුවත, (1996) සංස්: ලබුගම ලංකානන්ද හිමි, සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව, කොළඹ.

මහාවංශය, (1967) සංස්: එච්. සුමංගල ස්ථවිර හා පණ්ඩිත බටුවන්තුඩාවේ, රත්නකාර පොත් මුද්‍රණාලය, කොළඹ

විජයදාස, කේ. එච්. ජේ. (2007) ජයසිරි මහ බෝ සිරිත, තරංජි ප්‍රින්ටර්ස්, මහරගම.

විමලකිත්ති හිමි, මැදඋයන්ගොඩ. (1957) ශිලාලේඛන සංග්‍රහය. 4වන කොටස ඩී. පී. දොඩංගොඩ සහ සමාගම , මොරටුව.

ශාසනාවතීර්ණ වර්ණනාව (1956) සංස්: සී. ඊ, ගොඩකුඹුරේ ඩී. පී දොඩංගොඩ සහ සමාගම, මොරටුව.

සිංහල විශ්වකෝෂය 4 කාණ්ඩය (ඉන්දු උරස්) (1970) සංස්: ඩී. ඊ. හෙට්ටිආරච්චි, සංස්කෘතික දෙපාර්තමේන්තුව.

සීලක්ඛන්ධ හිමි, තුඹුල්ලේ,. (1989) පූජිත ජීවිත පළමු වෙළුම, සංස්: අමරසිරි පොන්නම්පෙරුම, රංජිත් අමරකීර්ති පළිහපිටිය. අධ්‍යාපන, සංස්කෘතික කටයුතු හා ප්‍රවෘත්ති අමාත්‍යාංශය.

ශීලවංශ තිස්ස හිමි, අම්පිටියේ, (2012) වෙල්ගම් වෙහෙර හා මානාවතු නුවර, පසිඳු ග්‍රැෆික්ස්, පන්නිපිටිය.

සීලරතන හිමි, හීනටිපනේ, (2014) පාලි අටුවාවල එන පැරණි ලක්දිව බණ කතා, ඇස්. ගොඩගේ සහෝදරයෝ. මරදාන.